සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## ලකුණු දීමේ පටිපාටිය



PAST PAPERS WIKI

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

PAST PAPERS WIKI

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
### 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
### ලකුණු දීමේ පටිපාටිය

**I පත්‍රය** - 1 x 40 = ලකුණු 40

**II පත්‍රය** -

| | | | |
|---|---|---|---|
| 01. ප්‍රශ්නය - | 2 x 10 | = ලකුණු 20 | |
| 02. ප්‍රශ්නය - | | = ලකුණු 25 | |
| 03. ප්‍රශ්නය - | | = ලකුණු 10 | |
| 04. ප්‍රශ්නය - | | = ලකුණු 10 | |
| 05. ප්‍රශ්නය - | | = ලකුණු 15 | |
| | එකතුව | = ලකුණු 80 | |
| | | | = ලකුණු 80 |

**III පත්‍රය** -

| | | | |
|---|---|---|---|
| 01. ප්‍රශ්නය - | 2 x 10 | = ලකුණු 20 | |
| 02. ප්‍රශ්නය - | 4 x 5 | = ලකුණු 20 | |
| 03. ප්‍රශ්නය - | | = ලකුණු 15 | |
| 04. ප්‍රශ්නය - | | = ලකුණු 15 | |
| 05. ප්‍රශ්නය<br>06. ප්‍රශ්නය<br>07. ප්‍රශ්නය | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු යි. | = ලකුණු 10 | |
| | එකතුව | = ලකුණු 80 | |
| | | | = ලකුණු 80 |

### අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | = | 40 |
| II පත්‍රයට ලකුණු | = | 80 |
| III පත්‍රයට ලකුණු | = | 80 |
| එකතුව | = | 200 |
| අවසාන ලකුණු | = | 200 ÷ 2 |
| | = | 100 |

PAST PAPERS WIKI

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ....................................................  
....................................................  
.................................................... √ △ $\frac{4}{5}$

(ii) ....................................................  
....................................................  
.................................................... √ △ $\frac{3}{5}$

(iii) ....................................................  
....................................................  
.................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

PAST PAPERS WIKI

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

| | |
|---|---|
| සැ.යු :- | **සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.** |

PAST PAPERS WIKI

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

## අභිමතාර්ථ
## I පත්‍රය

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයින්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## II පත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නය කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය, ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. 2 ප්‍රශ්නය රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති රචනා මාතෘකා හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 ප්‍රශ්නය සාරාංශකරණය යි. දී ඇති ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයින්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මෙන් ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහි දී පරීක්ෂා කෙරේ.

4 ප්‍රශ්නය අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 ප්‍රශ්නයේ දී අපේක්ෂකයින් විවිධ ලේඛන ලිවීමේ දී දක්වන දක්ෂතාව, ප්‍රායෝගික ලේඛන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ අත් පත්‍රිකාවක් සැකසීම යි. එහි ම අනෙක් ප්‍රශ්නය වනුයේ ප්‍රවෘත්තිපත්‍ර වාර්තාවක් සකස් කිරීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීම පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහි දී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමට යි. 3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමු වෙයි.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීම යි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර, අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතු ය.

PAST PAPERS WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II |
| சிங்கள மொழியும் இலக்கியமும் | I, II |
| Sinhala Language and Literature | I, II |

2018.12.04 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ඔහු අදහස් ප්‍රකාශ කළේ **උගුරට හොරා බෙහෙත් කන්නා සේ** ය.
   (1) කිසිවකුට නොදැනෙන්නාක් මෙන්
   (2) උගුරට නොදැනෙන පරිදි බෙහෙත් ගිලින්නාක් සේ
   (3) අනුන්ගේ බලකිරීම ඉටු කරන්නාක් මෙන්
   (4) යමක් වසන් කරන්නාක් මෙන්

2. **අල්ලේ පැළවෙන බොරු** කීමෙන් සමහරු තම කීර්තිනාමය නැති කර ගනිති.
   (1) කෙනකු රවටන බොරු බස් (2) කෙසේ වත් විශ්වාස කළ නොහැකි දේ
   (3) ඇදහීමට තරමක් දුෂ්කර කරුණු (4) අල්ල මත පැළවෙන දේ

3. කියන දෙයක් **වහෙන් මරෝ** නො කියා කෙළින් කියන්න.
   (1) සෘජු ආකාරයෙන් (2) වහෙන් මරෝ යන ලෙසින්
   (3) ව්‍යංග්‍යයෙන් (4) කෙනකුට නොදැනෙන අයුරින්

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. තාරකා විද්‍යාඥයෝ උපකරණ භාවිතයෙන් ග්‍රහවස්තූන්ගේ පිහිටීම ................ කර අනාවැකි පළ කරති.
   (1) පරීක්ෂණය (2) නිරීක්ෂණය (3) අධීක්ෂණය (4) අන්වේෂණය

5. භාෂාවක අර්ථ ප්‍රකට කිරීමෙහි ලා ................ ඉතා වැදගත් ය.
   (1) ශබ්දෝච්චාරණය (2) සුබෝච්චාරණය (3) සාවද්‍යෝච්චාරණය (4) අනුච්චාරණය

6. අධ්‍යාපනයෙහි දී ................ හිමි විය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නො ව ගුණාත්මකභාවයට ය.
   (1) ප්‍රමුඛත්වය (2) ප්‍රබලත්වය (3) යෝග්‍යත්වය (4) උචිතත්වය

PAST PAPERS WIKI

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අවිස්සාවේල්ල, අම්පාර, අඹේවෙල
(2) රත්නපුරය, රන්වැලි, රන්දෙණිගල, රතුපස්වල
(3) කඩුවෙල, කතරගම, කන්කසන්තුරේ, කල්මුනේ
(4) ගල්කිස්ස, ගල්ගමුව, ගම්පොළ, ගණේමුල්ල

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) විරෝද්ධාර, මර්දනය, ප්‍රතිඵල, ප්‍රස්තාවනාව
(2) දර්ශන, විමර්ශණ, ඝර්ෂණ, තීක්ෂ්ණ
(3) නර්තන, නිශ්ශංකමල්ල, ලංකේශ්වර, වර්ධනය
(4) නින්දාලාප, කර්ණරසායන, සංශරණය, ප්‍රතිලාභ

9. එක් එක් වචනයේ **දෙවෙනි අකුරෙහි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, ඇදය හා ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අභූත, විවෘත, අලියා, නිවැරදි
(2) අලියා, අභූත, විවෘත, නිවැරදි
(3) විවෘත, අලියා, නිවැරදි, අභූත
(4) අලියා, අභූත, නිවැරදි, විවෘත

10. 'රතුපුල්' යන්න අයත් වන්නේ,
(1) අන්‍යාර්ථ සමාසයට ය.
(2) විශේෂණ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය.
(4) අව්‍යය සමාසයට ය.

11. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) දරුවෙක්, මම, දෙවඟනක්, ලේඛකයෝ
(2) ළමයින්, මිනිසා, වඳුරෙක්, ශිෂ්‍යාවක
(3) මං, බබකු, නායක්, ගුරුවරු
(4) ධාවකයෙක්, නිළියක්, තා, දිවියෙක්

12. 'ප්‍රසංග + ඉක' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රාසාංගික (2) ප්‍රසාංගික (3) ප්‍රාසංගික (4) ප්‍රසංගික

13. "භයානක වග වලස් ආදීහු වනයෙහි ඔබ-මොබ සැරි සරති." යන වාක්‍යයේ 'වනයෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) සම්බන්ධ (2) ආධාර (3) සම්ප්‍රදාන (4) කර්ම

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. වත්මන් තරුණ පරපුරට සාහිත්‍ය මූලධර්ම පිළිබඳ **පෘථුල** අවබෝධයක් නැත.
(1) ප්‍රමාණවත් (2) පරිණත (3) පළල් (4) ගැඹුරු

15. යුද්ධයෙන් දිනීමට නම් සතුරු සේනා **මූලෝත්පාටනය** කළ යුතු ය.
(1) ඝාතනය
(2) මුලින්උපුටා දැමීම
(3) උදුරා දැමීම
(4) ඡේදනය

16. 'ව' යනු **දන්තෞෂ්ඨජ** අක්ෂරයකි.
(1) දත්වලින් හටගන්නා
(2) තොල්වලින් හටගන්නා
(3) දත්වලින් හා බොටුවෙන් හටගන්නා
(4) දත්වලින් හා තොල්වලින් හටගන්නා

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) තද්ධිත - සිරිමත්, දිරිමත්, කුල්මත්, ඉසුරුමත්
(2) සන්ධි - නිලුපුල්, වමත, දබරැඟිල්ල, පුරගත
(3) කෘදන්ත - නැවිලි, පැතිලි, දිවිලි, විමසිලි
(4) විධික්‍රියා - බලව, කරව, කියනු, දුව

18. දී ඇති වචන ගොනු අතුරෙන් අභ්‍යන්තර වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නො පවත්නා** පද පෙළිය තෝරන්න.
(1) ලෝපය, ආදේශය, ආගමය, දීර්ඝය
(2) කණ්ඨජ, ඔෂ්ඨජ, තාලුජ, මූර්ධජ
(3) ත්‍රිකෝණය, චතුරස්‍රය, රොම්බසය, ෂඩාස්‍රය
(4) පුස්තකය, පරිච්ඡේදය, ඡේදය, වාක්‍යය

PAST PAPERS WIKI

● අංක 29 හා 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) මම ද නංගී ද මල්ලී ද ගමට යති.
(2) මම ද නංගී ද මල්ලී ද ගමට යමු.
(3) මම ද නංගී ද මල්ලී ද ගමට යයි.
(4) නංගී ද මල්ලී ද මම ද ගමට යමි.

30. (1) ගායකයෝ ගී නො ගයති'යි පිරිස හූ කීහ.
(2) දරුවන් පිණිස යමක් කරන්නැ'යි නගරාධිපතිතුමා ඉල්ලා සිටියහ.
(3) සියලු ජාතීන් සාමයෙන් ජීවත් වෙත්වා!
(4) එදිරිවීර සරච්චන්ද්‍ර දක්ෂ නාට්‍යකරුවකු මෙන් ම ප්‍රකට නවකථා රචකයෙක් ද විය.

31. A - පොදු ජනයාගේ දැන ගැනීම ........................ මේ පත්‍රිකාව බෙදා හරිමි.
B - ගුරුවරුන් එතැනට පැමිණි ........................ ශිෂ්‍යයෝ අරගලය නතර කළහ.
C - ගුත්තිල පඬිතුමා, මූසිල දරුවකු ........................ රැක බලා ගත්තේ ය.
D - කොග්ගල මහා ප්‍රාඥයා ........................ මාර්ටින් වික්‍රමසිංහ ගම්පෙරළිය රචනා කළේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E - මෙන් F - උදෙසා G - හෙවත් H - නිසා

(1) H, E, F, G (2) F, E, G, H (3) F, H, E, G (4) F, E, H, G

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මං ඉඳ හිට වෙල පැත්තට යනවා"
(1) මම කලාතුරකින් කුඹුර දෙසට යමි.
(2) මම බොහෝ කලකට පසු කුඹුරට යමි.
(3) මම ඉඳ හිට කුඹුර දෙසට ගොස් පැමිණෙමි.
(4) මම මාස කිහිපයකට පසු ව කුඹුරට යමි.

33. 'හඳ සහ නිව්යෝර්ක් නුවර' නමැති පද්‍ය නිර්මාණය
(1) ගුණදාස අමරසේකරගේ ය.
(2) මහගම සේකරගේ ය.
(3) විමල් දිසානායකගේ ය.
(4) පරාක්‍රම කොඩිතුවක්කුගේ ය.

34. රූපකයක් රහිත වරණය තෝරන්න.
(1) රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදී
(2) කුරා කුහුඹු මිනිස් යන්ත්‍ර
(3) මී දේ දුව ඉසට නැගු ව - ඉඳුනිල් මිණි ජෙස්සතක් ය
(4) මීහිලිය නළලේ අංජන තිලකේ

35. "හිරි ඔතප් ලද නියාවට කාරණ පැවා සේ වාලධිය අමුඩු හස්සෙහි ගත්වා" යන පාඨයෙහි 'වාලධිය' යන වචනයේ අර්ථය කුමක් ද?
(1) අසූ පස කකුල
(2) කන්දෙක
(3) අමුඩය
(4) වල්ගය

36. පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.

"පෙර විරුවන් ඔබගෙ පුතේ
ඉදි කළ වැව් බලන් පුතේ
..........................................
ඒ මහ වැව් බැඳුණේ පුතේ"

(1) දෑ උරුමය ඇතිව සිතේ
(2) දැතේ සවියෙනුයි පුතේ
(3) සුරුවිරුකම් ඔබට ඇතේ
(4) මුළු බිම දෙස බලන් පුතේ

PAST PAPERS WIKI

37. "ඔන්න මං ගැටය කාලෙ නං ජෝරු අගමැතිතුමා ඉස්සරහ, මහ රැජින ඉස්සරහ, සියං කුමාරයා ඉස්සරහ නැටුං නටලා ප්‍රශංසා ලබලා තියෙනවා" මේ සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(1) කල මල පිපිලා
(2) හුණුවටයේ කතාව
(3) සිංහබාහු
(4) ගුරුතරුව

38. හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ දී 'වාංපතුල්' යනු,

(1) මර උගුල් ය.
(2) වඳුරන්ගේ පාදයන් ය.
(3) පාවහන් ය.
(4) සතුන්ගේ හම්පොතු ය.

39.
"උදුළ සොමි කැලුම් නිසයුරු හිමි සුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවන් තල සිරි යහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරුවැළ"

යන කවියෙන් කියැවෙන්නේ,

(1) වන වැනුමක් ගැන ය.
(2) හිරු බැස යන අවස්ථාවක් ගැන ය.
(3) රජතුගේ සිරි යහනක් ගැන ය.
(4) නිශා වර්ණනයක් ගැන ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

"මතු පිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංග්‍යාර්ථය ද අවබෝධ කළ යුතු ය. එසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නොව හෘදයගෝචර වන කොටස ද දත යුතු ය."

(1) වචනාර්ථය හා ව්‍යංග්‍යයෙන් කියවෙන අර්ථ අවබෝධ කළ යුතු අතර හදවතට හා බුද්ධියට ගෝචර වන කොටස් දැන ගැනීම ප්‍රමාණවත් ය.
(2) මතු පිටින් පෙනෙන අර්ථ හා ව්‍යංග්‍යයෙන් කියැවෙන කොටස් අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.
(3) වචනයේ මතු පිට අර්ථය මෙන් ම ව්‍යංග්‍යයෙන් කියැවෙන අර්ථය ද බුද්ධියට ගොදුරු වන කොටස මෙන් ම හදවතට ගොදුරු වන කොටස ද අවබෝධ කර ගත යුතු ය.
(4) මතු පිටින් පෙනෙන වචනාර්ථය අවබෝධ කළ යුතු අතර බුද්ධිගෝචර හා හෘදයගෝචර කොටස් දැන ගත යුතු ය.

* *

PAST PAPERS WIKI

**රහස්‍යයි**

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: **21**

විෂයය / பாடம்: **සිංහල භාෂාව හා සාහිත්‍යය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 1 | 31. | 3 |
| 02. | 2 | 12. | 3 | 22. | 2 | 32. | 1 |
| 03. | 3 | 13. | 2 | 23. | 4 | 33. | 2 |
| 04. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 1 |
| 05. | 1 | 15. | 2 | 25. | 3 | 35. | 4 |
| 06. | 1 | 16. | 4 | 26. | 4 | 36. | 2 |
| 07. | 3 | 17. | 1 | 27. | 1 | 37. | 1 |
| 08. | 1 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 09. | 4 | 19. | 4 | 29. | 2 | 39. | 4 |
| 10. | 2 | 20. | 3 | 30. | 4 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

PAST PAPERS WIKI

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## II පත්‍රය

ප්‍රශ්න අංකය 01

අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.

(අ) වළ (ආ) වල

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.

"ඒ සමිතියේ සභාපතිත්වය දරණ කැතැත්තා දේශදේශාන්තරයෙහි කීර්කියක් ඇති අග්‍රගන්‍ය ෂඞ්වරයෙකි."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා, සන්ධි වර්ගය නම් කරන්න.

(අ) සහ + උදර (ආ) රුක් + අත්තන

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **උපසර්ග පද දෙකක්** උපුටා දක්වන්න.

"අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රතිඵලදායක බව විදුහල්පතිතුමා පැවසීය."

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) පළල (ආ) සරල

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) තමාගේ ම අභිමතයට අනුව වැඩ කරන

(ආ) එක් ඇසක් පමණක් පෙනෙන තැනැත්තා

(vii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) අප සංගමයේ සභාපති නොහොත් සභාපතිනිය සභාව අමතන්නේ ය.

(ආ) ලාංකික ක්‍රීඩකයෝ තරගය ජය ගනිවි.

(viii) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) දරුවන් ගී **ගයද්දී** දෙමව්පියෝ තුටු වෙති.

(ආ) "**බල** සුබ නිමිති පෙරමග නැකතටත් වැඩි"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) පාසල් ශිෂ්‍යයා

(ආ) විදෙස් ප්‍රවෘත්ති

(x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද දෙක තෝරා වෙන වෙන ම ලියන්න.

"ගෙවල් දොරවල් බැලීමට පැමිණි කැපුණු යාගේ වංහුං ඇනගත් මවුපියෝ ඔහුට අකැමති වූහ."

(ලකුණු 02 x 10 = 20 යි)

PAST PAPERS WIKI

(i) (අ) ආවාටය, පොළවේ ගැඹුරට හෑරූ / කණින ලද / ස්වභාවික ව පිහිටි ස්ථානය

(ආ) වනය, වනාන්තරය, අරණ, අටවි, කැලෑව, අරණ්‍යය

(ii) දරන, අග්‍රගණ්‍ය

(iii) සහ + උදර = සහෝදර - ස්වරාදේශ සන්ධිය / සරදෙස් සඳ

රුක් + අත්තන = රුක්කත්තන - ද්විත්ව රූප සන්ධිය / දෙරූ සඳ

(iv) අප, අනු, ප්‍රති (උපසර්ගය සහිත පදය උපුටා දක්වා තිබුණ ද ලකුණු දෙන්න.)

(v) (අ) පටු, දිග, දීර්ඝ, ආයාම, අයම්

(ආ) සංකීර්ණ, සංහත

(vi) (අ) අත්තනෝමතික / හිතුවක්කාර

(ආ) කණා, කාණ

(vii) (අ) අප සංගමයේ සභාපති නොහොත් සභාපතිනිය සභාව අමතන්නී ය.

අප සංගමයේ සභාපතිනිය නොහොත් සභාපති සභාව අමතන්නේ ය.

(ආ) ලාංකික ක්‍රීඩකයන් තරගය ජය ගනිවි.

(viii) (අ) අසම්භාව්‍ය ක්‍රියා / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / ආවස්ථික කෘදන්ත

(ආ) විධි ක්‍රියා / විදි කිරිය

(ix) (අ) පාඨශාලා ශිෂ්‍යයා, පාසල් සිසුවා / පාසල් සිසු

(ආ) විදෙස් පුවත්, විදේශීය ප්‍රවෘත්ති / විදේශ ප්‍රවෘත්ති

(x) ගෙවල් දොරවල්, වං හුං

*(2 x 10 = 20)*

ප්‍රශ්න අංකය 02

අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

PAST PAPERS WIKI

2. පහත දැක්වෙන (අ). (ආ). (ඇ). (ඈ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ජංගම දුරකථනය මුළු ලෝකය ම සියතට ගත හැකි විස්මය ජනක උපකරණයකි. වර්තමානය වන විට එය බහුකාර්ය උපකරණයක් බවට පත්ව ඇත. මිනිසාගේ යහපතට මෙන් ම අයහපතට ද එය භාවිත කළ හැකි ය. නූතන තරුණ පරම්පරාව සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයට බෙහෙවින් ම ඇබ්බැහි වී ඇත්තේ ද ජංගම දුරකථනය නිසා ය. මේ අතර ජංගම දුරකථනය හා එමගින් භාවිත කළ හැකි සමාජ ජාලා වෙබ් අඩවි අධ්‍යාපනික කාර්යය මෙන් ම සමාජ යහපත ද වෙනුවෙන් භාවිත කළ හැකි අවස්ථා එමට ය. එය තරුණ පරම්පරාවේ අධ්‍යාපනික සංවර්ධනයට මෙන් ම සමාජ ප්‍රගමනයට ද රටේ සංවර්ධනයට ද දායක කර ගත හැකි ය. සමස්ත ප්‍රජාව ම මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලය එළඹ ඇත.

(ආ) ක්‍රීඩාව රටක සෞඛ්‍ය සම්පන්නභාවය පිළිබිඹු කරන දර්ශකයකි. ශ්‍රී ලංකාව ද විවිධ ක්‍රීඩා ඉසව් මගින් ලෝකය තුළ නමක් රඳවාගෙන ඇත. ක්‍රිකට්, මලල හා දැල්පන්දු ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. ක්‍රීඩාව මගින් රටේ තරුණ පරම්පරාවෙහි සෞඛ්‍යය, සමබර පෞරුෂය, නායකත්ව ගුණාංග, ජය පරාජය ඉවසීමේ ගුණය හා සාමූහිකත්වය ආදී යහපත් ගුණාංග රාශියක් වර්ධනය වේ. ක්‍රීඩාවට මුල් තැනක් දී ක්‍රීඩකයන් දිරිගැන්වීම රටක වගකීමක් හා යුතුකමක් වෙයි. නූතන පරම්පරාව ක්‍රීඩාව වෙත නැඹුරු කරවීමට අවශ්‍ය පෙලඹවීම ඇති කිරීමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමත් මගින් ශ්‍රී ලංකාව ලෝකයෙහි දිදුලන නාමයක් බවට පත් කර ගත හැකි ය.

(ඇ) ශ්‍රී ලංකාව විදේශීය සංචාරකයන්ගේ පාරාදීසයකි. අතීත මිනිසුන් විසින් දායාද කරන ලද්ව ප්‍රෞඪ ජාතියක අනන්‍යතාව රැක දෙන විවිධ විස්මිත නිර්මාණ ද ස්වභාව සෞන්දර්යයෙන් අනූන වූ ස්ථාන ද නරඹා සතුටු වීමට සංචාරකයෝ ඉමහත් කැමැත්තක් දක්වති. මෙරටට විශාල විදේශ විනිමයක් උපයා දෙන එම ජාතික උරුමයන් වර්තමානය වන විට විනාශ මුඛයට යමින් පවතින බව බොහෝ දෙනාගේ අදහස යි. මේ උරුමයන්ට හානි පමුණුවන්නේ ද මිනිසා ම ය. එබැවින් අනාගත පරම්පරාව සඳහා ඒවා රැකගැනීමට කටයුතු කිරීම අප සැමගේ වගකීමක් හා යුතුකමක් ද වේ.

(ඈ) ස්වාභාවික විපත් සහ ආපදා තත්ත්ව ගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් නිතර අසන්නට ලැබේ. ගංවතුර, නායයෑම් හා නියඟ වැනි තත්ත්ව ඒ අතර ප්‍රධාන වේ. මිනිසාට ජීවය දෙන පරිසරයට මිනිසා විසින් ම කරනු ලබන විවිධ අකටයුතුකම් නිසා ස්වභාව ධර්මය මිනිසාට එරෙහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ස්වාභාවික ව්‍යසන ඇති වේ යැයි සැලකේ. එම නිසා ස්වාභාවික විපත්වලින් ජනතාව මුදවා ගැනීමත් එමගින් විනාශ වන දේපළ හා ජීවිත රැකගැනීමත් සඳහා ක්‍රමෝපාය යෙදීම මිනිසාගේ පරම යුතුකම බව කිව යුතු ය.

(ලකුණු 25 යි)

(අ) ජංගම දුරකථනය සහ සමාජ ප්‍රගමනය

අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා ජංගම දුරකථන භාවිතය

(ආ) ක්‍රීඩාව මගින් ශ්‍රී ලංකාව ලෝකයේ දිදුලන රටක් බවට පත් කරමු

ශ්‍රී ලංකාව ලෝක පූජිත කිරීම සඳහා ක්‍රීඩාව බල ගන්වමු

ශ්‍රී ලංකා නාමය ලොව දිදුලන්නට ක්‍රීඩා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරමු

(ඇ) ජාතික උරුමයන් සුරකින සංචාරක ව්‍යාපාරයක අවශ්‍යතාව

සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ ජාතික අනන්‍යතාව රැක ගැනීම

ජාතික අනන්‍යතාව නොනසන සංචාරක ව්‍යාපාරයක් ගොඩ නගමු

(ඈ) ස්වාභාවික ආපදා කළමනාකරණය කර ගනිමු

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08යි |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12යි |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05යි |

| | | | |
|---|---|---|---|
| 01. | සාරවත්භාවය | - | ලකුණු 07යි |
| | විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම | - | ලකුණු 01යි |

PAST PAPERS WIKI

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතු යි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (X) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

ප්‍රශ්න අංකය 03
අපේක්ෂණය - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

3. පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

"වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවලට කිසිම හෝ සබඳකමක් නැති අපූරුවක් නොව ක්‍රමයෙන් වෙනස් වීමෙන් අලුත් ස්වරූපයක් ගත් පැරණි කෙටිකතාවමයි." යනු මාර්ටින් වික්‍රමසිංහගේ කියුමකි. ඔහු මේ මතය පවසන්නේ වර්තමාන සිංහල කෙටිකතාව අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, සිංහල ජාතක පොත යනාදි අපේ චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හා සම්බන්ධ කරමිනි. වික්‍රමසිංහ විශේෂයෙන් ම සිංහල ජාතක කථාත් වර්තමාන කෙටිකතාත් අතර බොහෝ සමාන ලක්ෂණ දකින්නේ වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලිනි. වර්තමාන කෙටිකතා ජාතක කථාවලින් වෙනස් වන්නේ වස්තු වින්‍යාසය අතින් බව ඔහු පෙන්වා දී ඇත්තේ ය.

චිරන්තන සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තාගේ කථා, ආදි ජන කතාන්තර, කවි කොළ යනාදි වශයෙන් කථා ප්‍රවෘත්ති කියැවෙන ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග රාශියක් අපට ඇත.

ප්‍රමාණය අනුව සලකන කල කෙටි වූ කතාවේ ඉතිහාසය බොහෝ ඈතට දිවෙන නමුත් නවකථාව, කෙටිකතාව යන නම් ඇති ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත නව සාහිත්‍යාංග දෙක සිංහලයට පුරුදු වූයේ බටහිර සාහිත්‍යයේ ආභාසය ඇති ව බව සිඳු මතා ය. මෙරට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු සාහිත්‍යය මෙහි පැතිරී යාමත් සමඟ ම ඒ සාහිත්‍යය ආදර්ශයට ගෙන ඉන් ආභාසය ලබමින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමට ගත් එක් උත්සාහයක එක් ප්‍රතිඵලයකි, මෙරට වර්තමාන කෙටිකතාව ආරම්භ වීම. එසේ ම සිංහල පුවත්පත් සඟරා ද කෙටිකතාවේ දියුණුවට මහත් රැකුලක් වූයේ ය.

(ලකුණු 10 යි)

PAST PAPERS WIKI

**සාරාංශකරණය :**

**අන්තර්ගතය**

(i) වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවල විකාසනයක් බව මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස යි.

(ii) වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලින් ජාතක කථා හා කෙටිකතා අතර සම්බන්ධතාවක් තිබුණත් වස්තු විකාසනය අතින් වෙනස් ය.

(iii) මේ හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තා ආදි ජනකතා හා කවි කොළ ඇතුළත් ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග පවතී.

(iv) නවකථාව, කෙටිකතාව යන ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත සාහිත්‍යාංග සිංහලයට හුරු වූයේ ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් පසු බටහිර පොත් කියවීමෙන් ලද ආභාසයෙනි.

(v) කෙටිකතාවේ දියුණුවට පුවත්පත්, සඟරා ඉවහල් විය.

සාරාංශකරණය:

මුළු ලකුණු ප්‍රමාණය 10 යි.

ලකුණු විග්‍රහය:

| | | |
|---|---|---|
| 01. | අන්තර්ගතය - | ලකුණු 06 යි. |
| 02. | වචන ගණන - | ලකුණු 02 යි. |
| 03. | ශිල්පීය දක්ෂතා - | ලකුණු 02 යි. |

★ වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.

★ වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.

★ ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.

★ එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණ 02කි.

★ වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.

★ දුර්වල සාරාංශ සඳහා බිංදුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

PAST PAPERS WIKI

ප්‍රශ්න අංකය 04
අපේක්ෂණය - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පූර්ව බෞද්ධ යුගයේ සමාජ ජීවිත තත්ත්වය පිළිබඳ වටිනා තොරතුරු රැසක් 'ජාතක කථා' මගින් අනාවරණය වන්නේ ය. ඒ සමාජයෙහි අධ්‍යාපනයට ලැබුණේ විශිෂ්ට තැනකි. මේ කථාවලට අනුව ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය අත් වූයේ බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට සහ ධනවත් ව්‍යාපාරිකයනට පමණි. ඒ සමාජයේ හැම විට ම පාහේ ගුරුකමෙහි නියුක්ත වූයේ බ්‍රාහ්මණ වංශිකයෙකි. හෙතෙම දිසාපාමොක් ඇදුරු –දිසාවේ ප්‍රධාන ආචාර්යවරයා– යනුවෙන් හැඳින්විණි. විශාල ප්‍රදේශයක ඉගැන්වීමේ කටයුතුවල භාරය පැවරුණේ එබඳු ආචාර්යවරයකුට ය.

දිසාපාමොක් ආචාරීන් කෙරෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි දේශපාලන විද්‍යාව සහ යුද්ධ පුහුණුවක් ද ඇතුළත් විය. මේ ඉගෙනීම වයස දහසය වන විට නිමාවට පත් කළ බව පෙනේ. තරුණයන් විවාහ ජීවිතයට ඇතුළු වීමත් පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීමත් සොළොස් වියෙහි දී සිදු වීම සාමාන්‍ය සිරිත විය.

සෑම පුරාතන සංස්කෘතියකට ම පොදු වූ අයුරින් භාරතීය සංස්කෘතියේ සියලු අධ්‍යාපන සහ අධ්‍යයන විධි වාචික මාධ්‍යය උපයෝගී කොට ගති. එවක ලිවීමේ කලාව ගැන දැනීම නුවූ බව මින් අදහස් නො කෙරෙයි. ලියුම් සහ වෙනත් ලේඛන ගැන සඳහන් නොයෙක් තැන් වෙයි. වෛදේහ රජුගේ බිසව වූ උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වෙයි. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග ඒ කථාවෙහි ම පැවසෙයි.

තව ද ශිෂ්‍යයන් යම් කරුණක් පොතපත කියවීමෙන් දැනගත් බව කිව හැකි නො වේ. කියවීම සඳහා පිළියෙල වූ පොතපතක් නො වූ බැවිනි. ගුරුවරයා කට වචනයෙන් ඉදිරිපත් කළ සූත්‍රයන් ඉගෙන ගෙන ධාරණය කරනු වස් නොයෙක් විට පුනරුච්චාරණය කිරීම ශිෂ්‍යයා විසින් කරනු ලැබිය යුතු ය. උගත් මිනිසා හැඳින්වූයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති යන අරුත දෙන බහුශ්‍රැත යන සකු වදනෙනි.

(i) ජාතක කථාවලින් හෙළිවන පරිදි ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය උදාවූයේ කවුරුන්ට ද?
(ii) දිසාපාමොක් ආචාරීන්ගෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි ඇතුළත් අංග කවරේ ද?
(iii) ජීවිතයේ සොළොස්වන විය වැදගත් කොට සලකනු ලැබීමට හේතු වූ කරුණු මොනවා ද?
(iv) පුරාතන භාරතීය සංස්කෘතියේ ලිවීමේ කලාව පැවති බව තහවුරු කිරීමට දක්වා ඇති සාධක කවරේ ද?
(v) පොතපත කියවීමෙන් නොව කට වචනය හා ධාරණය මුල් කොට ගෙන පැරණි ශිෂ්‍යයන් ශාස්ත්‍ර උගත් බව සනාථ කිරීමට මෙම ලේඛකයා යොදු සාධක දෙක මොනවා ද?

(ලකුණු 10 යි)

(i) බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට, ධනවත් ව්‍යාපාරිකයනට

*(කරුණු 03 ම ලියා ඇත්නම් ලකුණු 02 යි. කරුණු 02ක් ලියා ඇත්නම් ලකුණු 01 යි. එක කරුණක් ලියා ඇත්නම් ලකුණු නැත.)*

(ii) දේශපාලන විද්‍යාව, යුද්ධ පුහුණුව

*(ලකුණු 02 යි)*

(iii) i. තරුණයන් විවාහ දිවියට ඇතුළු වීම

ii. පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීම

*(ලකුණු 02 යි)*

(iv) i. උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වීම

ii. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග උම්මග්ග ජාතකයෙහි සඳහන් වීම

*(ලකුණු 02 යි)*

(v) පුනරුච්චාරණය කිරීම
උගත් මිනිසා 'බහුශ්‍රැත' යන නමින් හැඳින්වීම

*(ලකුණු 02 යි)*

PAST PAPERS WIKI

ප්‍රශ්න අංකය 05

අපේක්ෂණය - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම.

5. පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන **අත් පත්‍රිකාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

ජයනි කරුණාතිලක වන ඔබ අනුරාධපුර මහ විදියේ, අංක 42 දරන ස්ථානයේ 'සයුර' නමින් පොත්හලක් විවෘත කිරීමට සැලසුම් කරමින් සිටින්නෙහි ය. එය දිනපතා පෙ. ව. 8.00 සිට ප. ව. 7.00 තෙක් විවෘත ව තිබෙන අතර පෝය දිනවල දී වසා තැබේ. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාසල් උපකරණ ද මිලට ගැනීමේ අවස්ථාව මෙමගින් උදා කෙරෙයි. ජනවාරි මාසය තුළ මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10%ක වට්ටමක් ද ලබා දීමට අපේක්ෂා කෙරේ.

**නැතහොත්**

පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පතක පළකිරීම සඳහා යෝග්‍ය **වාර්තාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

කුරුසරුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද කලා උලෙළට සහභාගි වූ පුවත්පත් වාර්තාකරුවකුගේ සටහනක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දිනය | : | 2018.11.30 |
| වේලාව | : | ප. ව. 2.00 |
| ස්ථානය | : | ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය, කුරුසරුගම |
| ප්‍රධාන ආරාධිකයා | : | ප්‍රවීණ කලාකරු සමරනාථ එදිරිසූරිය |
| විශේෂ දේශනය | : | මහාචාර්ය සුසිල් රාජකරුණා |
| මාතෘකාව | : | සාහිත්‍යයේ නව ගමන්මග |

තිළිණ හා සහතිකපත් ජයග්‍රාහකයන් වෙත පිරිනැමීම මෙදින සිදු විය. ප්‍රදේශයේ සාහිත්‍යකරුවන් තිදෙනකුට ද 'සාහිත්‍යදීපනී' සම්මානය පිරිනැමිණි. නැටුම් ගැයුම් ආදි විචිත්‍රාංග රාශියක් ද තිබිණ. පුවත්පත් වාර්තාකරු ඔබ යැයි සිතන්න.

(ලකුණු 15 යි)

අත් පත්‍රිකාව

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය | ලකුණු 05 යි. |
| 2. | අන්තර්ගතය | ලකුණු 07 යි. |
| 3. | ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |
| | | මුළු ලකුණු 15 යි. |

1. **ආකෘතිය - ලකුණු 05 යි.**

| | |
|---|---|
| 1. ශීර්ෂ පාඨය / මාතෘකාව | ලකුණු 01 යි. |
| 2. පළ කරන්නාගේ නම | ලකුණු 01 යි. |
| 3. පළ කරන දිනය | ලකුණු 01 යි. |
| 4. නිර්මාණාත්මක භාවය | ලකුණු 02 යි. |

2. **අන්තර්ගතය - ලකුණු 07 යි.**

i. 'සයුර' නමින් පොත්හලක් විවෘත වන බව

ii. අංක 42, මහවීදිය, අනුරාධපුර ලිපිනයෙහි පිහිටා ඇති බව

iii. දිනපතා විවෘත ව තැබෙන බව

iv. විවෘත ව තැබෙන වේලාව පෙ.ව. 8.00 - ප.ව. 7.00 තෙක් බව

v. පෝය දිනවල වසා තැබෙන බව

vi. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාඨශාලා උපකරණ මිලට ගැනීමේ අවස්ථාව හිමි වන බව

vii. ජනවාරි මාසයෙහි මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10% ක වට්ටමක් හිමි වන බව

PAST PAPERS WIKI

3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

නැතහොත්

ප්‍රවෘත්ති පත්‍ර වාර්තාව

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1. ආකෘතිය ලකුණු 03 යි.
2. අන්තර්ගතය ලකුණු 09 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

1. ආකෘතිය - ලකුණු 03 යි.
   1. මාතෘකාව - ලකුණු 01 යි.
   2. වාර්තා කරන්නේ කවුරුන් ද යන වග - ලකුණු 01 යි.
   3. යෝග්‍යලෙස සිද්ධි ගළපා තිබීම - ලකුණු 01 යි.

2. අන්තර්ගතය - ලකුණු 09 යි.
   1. කලා උලෙළෙහි සංවිධායකයන් සම්බන්ධ ව
   2. දිනය හා වේලාව
   3. ස්ථානය
   4. ප්‍රධාන ආරාධිතයා
   5. විශේෂ දේශනය
   6. දේශන මාතෘකාව
   7. ජයග්‍රාහකයන් වෙත තිලිණ හා සහතිකපත් පිරිනැමීම
   8. 'සාහිත්‍යාදීපනී' සම්මානය
   9. නැටුම්, ගැයුම් ආදි විචිත්‍රාංග

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

PAST PAPERS WIKI

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# III පත්‍රය

❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

ප්‍රශ්න අංකය 01

අපේක්ෂණය - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20යි

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ කුමක් ද?
(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

(ii) ගුත්තිල ඇදුරු සඳ
.............................................
.............................................
සුදුසු අස්නෙක ගොසින් උන් සඳ
(අ) මෙම කවියේ මැද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iii) "මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ?"
(අ) මෙම පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(iv) නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත, නුඹ වේ
(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මෙම පද්‍ය බණ්ඩය ඇතුළත් පැදි පෙළේ නම කුමක් ද?

(v) "මම යන්නට නොනිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විශ්වාස් නැති."
(අ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය රචිත යුගය නම් කරන්න.
(ආ) මෙහි සඳහන් විශ්වාස නොකට යුතු සතර දෙනාගෙන් එක් අයකු සඳහන් කරන්න.

(vi) (අ) 'අපට වැසිකිළියක්' කෙටිකතාව ඇතුළත් කෙටිකතා සංග්‍රහය නම් කරන්න.
(ආ) මෙම කෙටිකතාවේ රචකයාගේ නාම කුමක් ද?

(vii) "හොඳට ම වැඩි වුණොත් ඒක වට්ටි ප්‍රැන්කු පන්සීයක්"
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?
(ආ) මෙහි 'ප්‍රැන්කු' යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

(viii) සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ
(අ) මේ පද්‍ය බණ්ඩය මුලින් ම පළ වූ කෘතිය කුමක් ද?
(ආ) මේ කෘතියේ රචකයා විසින් රචනා කරන ලද නවකතා දෙක නම් කරන්න.

PAST PAPERS WIKI

(ix) (අ) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය නම් කරන්න.

(ආ) "ගිම්හානයේ ගිලන් වී කෘශ ව        සුදුමැලි ව
ඇදී ඇදී ඉකි ගැසූ ගඟ කැවත  පිරිපුන් ය"
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාඨයෙන් පැවසෙන අදහස ලියන්න.

(x) (අ) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය දෙකක් නම් කරන්න.

(ආ) "සකිසඳ පෙනෙන් සම්තොළ ගල නැගෙනහිර"
මෙහි 'සකිසඳ' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇත්තේ කාට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

(i) (අ) මහෞෂධ පඬිතුමාගේ / බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රඥා මහිමය කියාපෑම.

(ආ) සසදාවත, මුවදෙව්දාවත, කව්සිළුමිණ

(ii) (අ) වීණා වයන ලෙස   ඉඳ

පසෙක පනවන   ලඳ

(ආ) උතුමා / උත්තමයා, උත්තමාර්ථ යන අරුත් ඇති ගෞරවාර්ථ පදයක්

ඒ වෙලාවෙ / ඒ මොහොතෙ / ඒ අවස්ථාවෙ / කල්හි

(iii) (අ) බැද්දේගම

(ආ) පුංචිරාළ / වෙදරාළ / රාළහාමි

(iv) (අ) රූපක / රූපකාලංකාරය

(ආ) ජාතික කොට්ටල්ල හෙවත් දරු නැළවිල්ල / මුනි සිරිපා සිඹිමින්නේ

(v) (අ) පොළොන්නරු යුගය

(ආ) සොරා, මුලින් අතුරා වාඩිවී සිටි කොළ, රජතුමා, කාන්තාව

(vi) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා

(ආ) කේ. ජයතිලක මහතා

(vii) (අ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය

(ආ) ප්‍රංශයේ ව්‍යවහාර මුදල් ඒකකය / මුදල් ඒකකයක්

(viii) (අ) ප්‍රබුද්ධ

(ආ) කුං මං හංදිය, මනෝ මන්දිර

(ix) (අ) බිය නොවන් අයියණ්ඩි

(ආ) ග්‍රීෂ්ම / උෂ්ණ / වියළි කාලයේ ගඟේ වතුර අඩුවී, ජලයේ පැහැය වෙනස් වී, ගඟ හෙමින් ගලා යන බව

PAST PAPERS
WIKI

(ix) (අ) හංස, සැළලිහිණි, ගිරා, කෝකිල, පරෙවි

(ආ) සැළලිහිණියාට

ප්‍රශ්න අංකය 02

අපේක්ෂණය - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ අවබෝධය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20යි (එක් කොටසකට ලකුණු 04 බැගින්)

(අ) කොටස *ලකුණු 02යි*

(ආ) කොටස *ලකුණු 02යි*

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) **රිවි තැවුලේ** පිපි කමලේ විල් ගැවසී
**මත කොවුලේ** කුරු වදලේ හඬන නිසී
වන සැවුලේ මඟ අසලේ පෝර සැලසී
ගුරු බැවුලේ යව අවුලේ කොවි කිසී

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මෙම කවියෙන් කියැවෙන ගුරු බැවුලේ ස්වභාවය විස්තර කරන්න.

(ii) "තෙල ලෙස කිරීම තොපටත් අපටත් තරම් නොවෙයි. තරම් තැනකින් සරණක් ගෙනවුත් පාවා දෙමිහ."

(අ) මෙහි තරම් නොවෙයි යන්නෙන් අදහස් කළේ කුමක් ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ කැනැත්තා දැක්වූ ප්‍රතිචාරය කුමක් ද?

(iii) "තො අඟුල්මල්හු කෙනෙ බහා සිවුරු හැඳ පෙරෙවැ පැවිජි වැ පණිවා ඇ පව්කැමින් විරත වැ එක් වෙමළ වළඳා බඹසරවත් රැකැ සිල්වත් වැ කලණදහම් පුරා වසන්නහු දිටිහි නම්, උහුට කුමක් කෙරෙහි?"

(අ) මෙම පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) දුටු සක සිකට තුටු වන ලෙසට නිතියෙනි
සතර'ත එකට සම කර බෙර ඇසක් මෙනි
පැහැපක සුද නොකළ වැලි අතුළ මළු තැනි
මිහිකත සඳන'ලෙවි දුන් උර මඬල වැනි

(අ) ඉහත සඳහන් කවියෙහි අන්තර්ගත උපමා දෙකක් ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v) රැකි වනපෙතිනැවිදින් **කුඹුවෝයා**
කිති මියුරැකි වෙණ නදළමුවෝයා
සිකිවිළි නැකි රූ විලස මුවෝයා
කැකි නොගනිති මිනිසුන් **සමුවෝයා**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මුවන්ගේ මෙම හැසිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ලකුණු 04 × 5 = 20 යි)

(i) (අ) රිවි තැවුලේ - සූර්ය තාපය / හිරු රැසින් තැවී ගිය / සූර්ය රශ්මියෙන් තැවී ගිය / හිරු රැසින් පීඩාවට පත් / සූර්ය තාපයෙන් තැවී ගිය

මත කොවුලේ - ප්‍රීතියෙන් උද්දාමයට පත් වූ කොවුලන් / මත් වූ කෝකිලයන් / මත් වූ කොවුලන්

(ආ) හිරු රැසින් පිපුණු නෙලුම් මල්වලින් යුක්ත විල් පැවතීම

මත් වූ කෝකිලයන් කුරු වදුලේ සිට මැනවින් නාද කිරීම

වලි කුකුළන් මාර්ගය අසල පොරයෙහි යෙදී සිටීම

PAST PAPERS WIKI

(ii) (අ) (විවාහයට) සුදුසු නො වේ / නො ගැළපෙයි / යෝග්‍ය නො වේ / උචිත නො වේ

(ආ) නොපිළිගැනීම / එකඟ නොවීම / නොගිවිසීම

(iii) (අ) ඔබ / නුඹ (කොසොල් රජ) අංගුලිමාල කෙස් කපා / හිස මුඩු කොට සිවුරු ඇඳ, පොරවා ගෙන පැවිදි වී ප්‍රාණඝාත / සතුන් මැරීම ආදි පාප කර්මවලින් ඉවත් වී (දවසකට) එක් වේලක් පමණක් ආහාර ගනිමින් බ්‍රාහ්මචාරී / උතුම් හැසිරීම්වලින් යුතු ව සිල් ආරක්ෂා කරමින් කල්‍යාණ ධර්ම / යහපත් ධර්ම අනුගමනය කරමින් වාසය කරන අයුරු දුටුවේ නම් ඔහුට කුමක් කරන්නෙහි ද?

(ආ) කොසොල් රජතුමා අංගුලිමාල ඇල්ලීමට යන බව ප්‍රකාශ කළ අවස්ථාවේ දී බුදුන් වහන්සේ කොසොල් රජතුමාගෙන් මෙසේ විමසූ සේක.

(iv) (අ) බෙර ඇසක් මෙනි

සඳුන්'ලෙව් දුන් උරමඬල වැනි

(ආ) දකින ජනයාගේ සිතට නිත්‍ය වශයෙන් ම සතුට ඇති වන ලෙස සතර පැත්තෙන් ම එකම ආකාරයට බෙර ඇසක් මෙන් සමතලා කර සුදු පැහැති ලස්සන වැලි ඉස ඇති විහාර මිදුල් මහී කාන්තාවගේ සඳුන් ආලේප කළ උර ප්‍රදේශය මෙනි.

(v) (අ) සුමුවෝයා - රංචු ගැසී / එකට එක් වී / එක් රැස්වී / කාණ්ඩ වශයෙන් එකතු වී

සමුවෝයා - හමු වී / සම්මුඛ ව / අභිමුඛ ව

(ආ) ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනයේ මිහිරි බව

ප්‍රශ්න අංකය 03

ප්‍රශ්න අංක 03 - 07 තෙක්

| | | |
|---|---|---|
| අපේක්ෂණය | - | ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම |
| ලකුණු විග්‍රහය | - | 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - ලකුණු 15යි<br>5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතු යි. - ලකුණු 10යි |

3. බාහිර බලවේග නිසා පුද්ගල මනෝභාවයන්

(i) ප්‍රචණ්ඩත්වය කරා යොමු වන අයුරුත්

(ii) යළිත් ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන අයුරුත් 'අඟුල්මල් දමනය' කතාවෙන් මනාව නිරූපණය වෙයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(i) පරිසර වර්ණනා රසවත් ලෙස ඉදිරිපත් කිරීමටත්

(ii) යමක අසිරිය තත්ත්වාකාරයෙන් දැකීමටත් හංස සංදේශ කතුවරයා දක්වා ඇති කුසලතාව අගය කළ හැකි ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

PAST PAPERS WIKI

03. පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩත්වය හා ශික්ෂාකාමීත්වය උදෙසා බාහිර බලවේග හේතු වන ආකාරය අඟුල්මල් දමනය කතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් විමර්ශනය කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**(i)** ප්‍රචණ්ඩත්වය කරා යොමු වන ආකාරය

★ දිසාපාමොක් ඇදුරුතුමාගේ නියෝගය

★ වෙනත් ශිෂ්‍යයන්ගේ කේලාම් බස්

**(ii)** ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන ආකාරය

★ බුදුන් වහන්සේ හමුවීම හා එහි දී ඇති වන සාකච්ඡාව මගින් කරුණු අවබෝධ වීම

★ දරුණුකම නිසා ප්‍රචලිත වූ අංගුලිමාල යන නම වෙනුවට කොසොල් රජු 'භර්ගයො මන්ත්‍රාණි පුත්‍ර' යනුවෙන් මවුපියන්ගේ නම් මූලික කොට ගෙන තෙරුන් වහන්සේ හඳුන්වනු ලැබීම

★ සත්‍යක්‍රියා කොට මූඪගර්භ කාන්තාව සුවපත් කිරීමෙන් පසුව සමාජය විසින් අංගුලිමාල තෙරුන්ගේ යහපත් භාවය හා කරුණාවන්ත භාවය අගය කරනු ලැබීම

නැතහොත්

කෑරගල ගම හා වෙහෙර වැනුම ඇසුරු කර ගෙන කතුවරයා පරිසර වර්ණනයෙහි දක්වන දක්ෂතාව හා යමක අසිරිය තත්ත්වාකාරයෙන් දකින ආකාරය ඉදිරිපත් කළ යුතු ය.

**(i)** පරිසර වර්ණනා රසවත් ලෙස ඉදිරිපත් කරන ආකාරය

★ කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරැය.....

★ සාර පලය අඹ දඹ රඹ ද වල්පිට....

★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට....

★ මිහ'ඹ මුවමඬල මෙන් දිලෙන හැම විට....

★ කුඳුරු වැ සිහිලැ'ලී ය ගඟුලැ'ලී ය....

★ පවන'ද පිපි තුරේ ය නිර තුරේ ය....

**(ii)** යමක අසිරිය තත්ත්වාකාරයෙන් දැකීමේ කුසලතාව දක්වන ආකාරය

★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට....

★ දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය....

★ කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරැය....

★ නිබඳ පැසී පල ලඹ දෙන මිහිර'ඹය....

★ පවන'ද පිපි තුරේ ය නිර තුරේ ය....

PAST PAPERS WIKI

## ප්‍රශ්න අංකය 04

4. (i) උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමක්

(ii) පොදු ජන වහර යොදා ගැනීමක් 'භාභා හීය සාභා අඬහැරෙත් දැනේ' යන ජන කවි පෙළ පාඨකයාගේ සිත් ගනී. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(i) අවස්ථා හා සිද්ධි නිරූපණයක්

(ii) භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් සිංහබාහු නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

පාඨක සිත් ගැනීමට හේතු වූ උපදේශාත්මක හැඟීම් හා පොදු ජන වහර යොදා ගැනීම සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.

(i) උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීම

★ නහින දෙහින කාලෙට පින් කෙරුම යුත....

★ ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු....

★ ඇස නැති දා පොත ගත්තේ කියන්ටද....

★ එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා....

★ අඳුරු කරුවලේ පඳුරට මූවා වෙලා....

(ii) පොදු ජන වහර යොදා ගැනීම

★ නහින දෙහින කාලෙට පින් කෙරුම යුත

★ වහින කලට කුරින් විල්වලින් එත

★ වෙර නැති දා ගහගත්තේ දිනන්ට ද

★ දත නැති දා උක් දඬු ගිනි තපින්ටද

★ ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා

★ පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

★ අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා

නැතහොත්

අවස්ථා හා සිද්ධි නිරූපණයත් භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂිත ය.

(i) අවස්ථා හා සිද්ධි නිරූපණය

★ සිංහබාහු හා සිංහසීවලී තුළ පැවති සැකය දුරු කිරීමට සුප්පා දේවිය දරන උත්සාහය හා ඇගේ ක්‍රියාකලාපය දැක්වෙන අවස්ථා

★ ලෙනෙන් පිට ව යාමට දරන ප්‍රයත්නය

★ සුප්පා දේවිය දෙගිඩියාවකට පත් වන අවස්ථාව

★ සිංහයාගේ ප්‍රකෝපකාරීත්වය හා පශ්චාත්තාපය දක්වන අවස්ථාව

PAST PAPERS WIKI

**(ii) භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරය**

★ **අවස්ථාවට යෝග්‍ය ලෙස භාෂාව යොදා ගැනීම**

සිංහබාහුගේ සිත තුළ පවතින සැකය

සිත නොම සැනසේ හිඳිනට මෙලෙසේ - දිවි හිමියෙන් මෙ ලෙනේ

අප නරයන් වග පැවසූ එ අරුමය - නැත මට වැටහෙන්නේ

★ **ලෙනෙන් පිට ව යාමට දරන උත්සාහය**

කුමුල ගතින්දා - බාහු බෙලෙන්දා

වෙමි සේ තිදසින්දා

කුරිරු ගිජින්දා - කුඹු තල සින්දා

ලමි සේ කෙසරින්දා

මා පිය මිගිඳා කරනා විකුමන්

ඇයි මට බැරි වන්නේ

★ **සුප්පා දේවියගේ සිතෙහි දෙගිඩියාව**

දෙවියන් බාරයි මා සමිඳා

මා වෙත නොවනු ය කෝපා

දරුවන් සන්දා - කරනෙමි මෙබන්දා

★ **සිංහයාගේ ප්‍රකෝපකාරී ස්වභාවය**

ගල් ලෙන බිඳලා

ලෙන් දොර හැරලා

සිංහබා සිංහබා සිංහබා

ලෙන තුළ නො වෙති

පෙරළා නො එති

මම දැන ගතිමි මම සැක කළෙමි

හෙණයක් සේ පතිත වූ අහසින්

හිස මතට දෙදරුම් දී

බමවා ම ඉඳුරන් අඳුරු කරමින්

පහරිනා රුදුරු

★ **චරිතවලට යෝග්‍ය ලෙස භාෂාව යෙදීම**

සුරතල් දියණිය - මොලකැටි වදනින්

මා සනසන්නිය - අහර පිසන්නිය

කවන්නිය, පොවන්නිය

මා ගැන බිය වන්නිය

සේ රිවි බිම්බා පතළ තෙද බලැති මහරු

මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් සපිරු

PAST PAPERS WIKI

ඔබ දෙදෙන මා සමග
නො ආවොත් යන්ට වේ
ඔබ දමා මේ ලෙනේ
මට උරුම වූ දිවිය
මා සොයා යා යුතුයි
කුමක් දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ
සෙතක්දෝ

★ උපමාලංකාර සහිත භාෂා භාවිතය, අනුප්‍රාසවත් භාෂා ව්‍යවහාරය, ගීතමය භාෂා යෝජනය, සම්භාව්‍ය සාහිත්‍ය භාෂා භාවිතය හා විවිධ රස ජනනය වන යෙදුම් ආදි කරුණු යටතේ උදාහරණ දක්වමින් පිළිතුරු ලියා තිබීම අවශ්‍ය ය.

ප්‍රශ්න අංකය 05
අපේක්ෂණය - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම.

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**5.** විරුද්ධවාදීන්ගේ යුද්ධෝපක්‍රමවලට ප්‍රතික්‍රියා දැක්වීමේ දී මහෞෂධ පඬිවරයා පෙන්වූ කුසලතාව උම්මග්ග ජාතකයේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

පහත දැක්වෙන කරුණු ආශ්‍රිත ව විමර්ශනය කිරීම මෙහි දී වැදගත් වේ.

★ සතුරු පක්ෂයේ යුද්ධෝපක්‍රම දැන ගැනීම සඳහා චරපුරුෂයන් යෙදීම
★ ජලය, වී සහල්, දර ආදිය ඇතුළු නුවරට ගෙන යාම නැවැත්වීමේ උපක්‍රමය ව්‍යර්ථ කිරීම
★ ජයපානෝත්සවය පැවැත්වීමට ඉඩ නොදීම
★ මියුලු නුවර වටලා ගත් පසු සැණකෙළි පැවැත්වීම
★ ධර්ම යුද්ධය ජයග්‍රහණය කිරීම

ප්‍රශ්න අංකය 06

**6.** පවුල් සංස්ථාවේ සමබරතාව ආරක්ෂා කිරීමේ දී ස්වාමි පුරුෂයකුගේ වගකීම මැනවින් නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටිකතාවේ ලොයිසල්ගේ චරිතය උපයෝගී කරගත් ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

ලොයිසල් සැමියකුගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීමට උත්සාහ ගත් ආකාරය දැක්වීමේ දී පහත සඳහන් නිදසුන් දැක්විය හැකි ය.

★ අධ්‍යාපන අමාත්‍යවරයාගේ ප්‍රිය සාදයට සහභාගි වීම සඳහා ආරාධනා පත්‍රය ලබා ගැනීම
★ තම බිරිඳ සකසන ආහාරවල රසය අගය කිරීම
★ බිරිඳට ඇඳුමක් මිල දී ගැනීම වෙනුවෙන් තම මුදල් පරිත්‍යාග කිරීම
★ තම බිරිඳගේ සතුට වෙනුවෙන් උත්සව අවස්ථාවේ කාමරයකට වී රාත්‍රී කාලය ගත කිරීම
★ තම බිරිඳ ගැටලු සහගත තත්ත්වයකට පත් වූ විට ඇයට සහාය වීම සඳහා බොහෝ දුක් විඳීම

PAST PAPERS WIKI

## ප්‍රශ්න අංකය 07

7. පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා 'ජාතික තොටිල්ල' පද්‍ය පන්තියෙන් නිරූපිත අදහස් උපයෝගී කර ගත හැකි ආකාරය, උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

නිර්දිෂ්ට පද්‍ය පන්තියෙන් පුද්ගල චරිත සංවර්ධනයට අදාළ ව අදහස් ඉදිරිපත් කර තිබීම අවශ්‍ය ය.

- ★ තමන් ලැබූ දිවි පෙවෙතේ....
- ★ ඉටු කොට කළ යුතු යුතුකම්....
- ★ කරදර දහසක් හමු වී....
- ★ කාටත් හිමි පොදු දේ නම්....
- ★ මිතුරුකමින් පෙරට එතොත්....
- ★ සිනිඳු මොළොක් බව මලෙහී....

PAST PAPERS WIKI